# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

# 2015

## කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்

## DEPARTMENT OF MANAGEMENT AUDIT

| | | |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය | நிதி அமைச்சு, | Ministry of Finance |
| මහලේකම් කාර්යාලය | செயலகம் | The Secretariat |
| කොළඹ 01. | கொழும்பு 01. | Colombo 01. |

*රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හි උපදෙස්වලට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.*

**කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව**

**මුදල් අමාත්‍යාංශය**

**මහලේකම් කාර්යාලය**

**කොළඹ 01.**

# පටුන


| අංකය | | පිටුව |
|---|---|---|
| 01. | දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන් | 01 |
| 1.1 | දැක්ම | 01 |
| 1.2 | මෙහෙවර | 01 |
| 1.3 | අරමුණු | 01 |
| 1.4 | කාර්යයන් | 02 |
| 02. | මූල්‍ය පරිපාලනය | 03 |
| 03. | භෞතික කාර්ය සාධනය | 04 |
| 3.1 | අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම | 04 |
| 3.2 | අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ සැපයීම | 05 |
| 3.3 | විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම | 06 |
| 3.4 | මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය | 06 |
| 3.5 | විශේෂ විමර්ශන හා විගණන කටයුතු | 07 |
| 3.6 | නව ප්‍රවේශයන් | 10 |
| 04. | මානව සම්පත් සංවර්ධනය හා පොදු පරිපාලනය | 11 |
| 4.1 | දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය | 11 |
| 4.2 | 2015.12.31 දිනට කාර්ය මණ්ඩලය | 12 |
| 4.3 | 2015 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු | 14 |
| 4.3.1 | 2015 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා | 14 |
| 4.3.2 | 2015 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා | 15 |
| 4.3.3 | කාර්යාභිවර්ධන වැඩසටහන් | 17 |

# 01. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන්

## 1.1 දැක්ම

ඉහළම කාර්යසාධනයකින් හා වගවීමකින් යුත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතුකරන විශිෂ්ඨතම කළමනාකරණ විගණන කොටස්කරු බවට පත්වීම.

## 1.2 මෙහෙවර

කළමනාකරණ විගණනය තුලින් රාජ්‍ය සේවයේ වගවීම ඉහළ නැංවීම හා වටිනාකම් එකතු කිරීම සඳහා ස්වාධීන හා අරමුණු කරා ලඟාවීම සහතික කෙරෙන උපදේශාත්මක සේවා සැපයීම.

## 1.3 අරමුණු

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි ඵලදායීත්වය ඉහල නැංවීම සඳහා දායකවීම.
2. විගණන හා කළමනාකරණ කමිටු මගින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.
3. කළමනාකරණ විගණනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හඳුන්වා දීම.
4. මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය මගින් ඉහළ කළමනාකාරිත්වයට සහායවීම.
5. සංවර්ධන ව්‍යාපෘතීන්හී කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
6. විශේෂ විමර්ශන කටයුතු තුලින් රාජ්‍ය අංශයේ සිදුවන හා සිදුවිය හැකි අක්‍රමිකතා අනාවරණය කිරීම හා එවැනි තත්ත්වයන් හා සිදුවීම් වළක්වා ගැනීමට නිර්දේශයන් සහ නිවාරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

## 1.4 කාර්යයන්

2008.01.25 දිනැති අංක. 08/0200/306/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස 2008.02.01 දින ස්ථාපනය කර ඇත්තේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරින් හා ගණන්දීමේ නිලධාරින්ට භාණ්ඩාගාරයෙන් ලැබෙන සහාය තවදුරටත් ශක්තිමත් කිරිමේ අරමුණිනි. ඒ අනුව අමාත්‍යාංශ හා අමාත්‍යාංශ යටතේ ස්ථාපිත කර ඇති ස්වාධීන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශවලට මඟ පෙන්වීමත් එමඟින් එම කටයුතු ශක්තිමත් කිරීමත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ.

### කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්යයන් :

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයේ ගුණාත්මකභාවය හා කාර්යක්‍ෂමතාවය ඉහළ නැංවීම සඳහා මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.

2. මුදල් අමාත්‍යාංශය, භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ ඒ යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ විගණනයට භාජනය කිරීම.

3. අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම.

4. අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය හා අවශ්‍ය මගපෙන්වීම් කිරීම.

5. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ අභ්‍යන්තර විගණන කුසලතා දියුණු කිරීම.

6. මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම සහ අනෙක් අමාත්‍යාංශවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා මඟපෙන්වීම.

7. රාජ්‍ය අංශය අනුගමනය කරන අවදානම් ඇගයීමේ ක්‍රමවේදයේ ප්‍රමාණාත්මක බව ඇගයීම.

8. විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම.

## 02. මූල්‍ය පරිපාලනය

2015 අයවැය ඇස්තමේන්තුව මගින් වැය ශීර්ෂ 324 වැඩසටහන අංක 01 ව්‍යාපෘතිය අංක 01 යටතේ මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබිණි. 2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සැකසීමේදී 2015 වර්ෂයේ ප්‍රතිපාදන සංශෝධනය කෙරුණි. එම ප්‍රතිපාදන වැය කළ ආකාරය පහත දැක්වේ.

| වියදම් විස්තරය | සංශෝධිත ඇස්තමේන්තු වෙන්කිරීම (රු.) | අමතර ප්‍රතිපාදන වෙන්කිරීම (රු.) | මු.රෙ. 66 හා 69 අනුව මාරු කිරීම් (රු.) | තත්‍ය වියදම (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් (අ) | **30,090,000** | **370,300** | **-** | **30,389,443** | **70,857** |
| පුද්ගල පඩිනඩි | 22,030,000 | | 40,123 (40,123) | 21,959,150 | **70,850** |
| අනෙකුත් වියදම් | 8,060,000 | 370,300 | 532,405 532,405 | 8,430,293 | 7 |
| මූලධන වියදම් (ආ) | **1,500,000** | | | **1,310,924** | **189,076** |
| **2001** ගොඩනැගිලි හා ඉදිකිරීම් | | | | | |
| **2002** යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා | 200,000 | | | 192,948 | 7,052 |
| **2102** ලීබඩු හා කාර්යාලීයඋපකරණ | 200,000 | | | 103,224 | 96,776 |
| **2103** යන්ත්‍ර හා උපකරණ | 600,000 | | | 521,697 | 78,303 |
| **2401** හැකියා වර්ධනය | 500,000 | | | 493,055 | 6,945 |
| මුළු එකතුව (අ) + (ආ) | **31,590,000** | **370,300** | | **31,700,367** | **259,933** |

### රජයේ නිලධරයන්ගේ අත්තිකාරම් ‘බී ’ ගිණුම

2015 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අනුමත අත්තිකාරම් ‘බී ’ගිණුමේ විස්තර පහත දැක්වේ.

| විස්තරය | අනුමත සීමාව (රු.) | තත්‍ය වියදම (රු.) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | **2,385,000** | **1,451,572** |
| අවම ලැබීම් සීමාව | **1,250,000** | **1,750,812** |
| උපරිම හර ශේෂ සීමාව | **10,000,000** | **6,052,647** |

# 03. භෞතික කාර්ය සාධනය

## 3.1. අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම

අභ්‍යන්තර විගණයෙන් අපේක්ෂිත පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්තව සිටින අභ්‍යන්තර විගණකවරුන්ගේ වෘත්තීය දැනුම ඉහළ නැංවීමට හා විගණනය පිළිබඳව කාලීන තොරතුරු ලබාදීමට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නිරතුරුවම කටයුතු කරයි. එම අරමුණ ඇතිව 2015 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් වැඩමුළු පවත්වන ලදී.

| පැවැත්වූ දිනය | වැඩමුළුවේ මාතෘකාව | සහභාගී වූ අය |
|---|---|---|
| 2015.08.06 | රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ වැඩමුළුව | අමාත්‍යාංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දෙපාර්තමේන්තුවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් |
| 2015.10.13 | වර්තමාන තොරතුරු තාක්ෂණ පරිසරයේදී අභ්‍යන්තර විගණකවරුන්ට ඇති අභියෝගයන් පිළිබඳ වැඩමුළුව | අමාත්‍යාංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දෙපාර්තමේන්තුවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් |
| 2015.11.05 | ප්‍රසම්පාදන අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කරලීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ කාලීන වෙනස්කම් පිළිබඳ වැඩමුළුව | අමාත්‍යාංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දෙපාර්තමේන්තුවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් |
| 2015.12.04 | තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩමුළුව | අමාත්‍යාංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දෙපාර්තමේන්තු ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් |

## 3.2 අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ සැපයීම

රාජ්‍ය ආයතනවල අභ්‍යන්තර විගණනය සඳහා පවත්නා මාර්ගෝපදේශ අදාල විෂය කේෂත්‍රයන්ට අනුකූලව සුවිශේෂ කොට සකස් කිරිම මගින් එම ක්ෂේත්‍රයන්හි විගණන කටයුතු වඩාත් කාර්යක්ෂම හා ඵලදායීව ඉටු කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ක්‍රියාමාර්ග ගනු ලැබ ඇත.

### 3.2.1. කාර්ය සාධන විගණනය පිළිබඳ මාර්ගෝපදේශය

මහජන මුදලින් ක්‍රියාත්මක රජයේ ආයතනවල විනිවිදභාවය හා ගිණුම් කටයුතු වල ස්වභාවය පරීක්ෂා කරමින් එම ආයතනවලින් අපේක්ෂිත සමස්ථ අරමුණු ඉටුවීම පිළිබඳ පරීක්ෂා කිරීමේ ක්රියාමාර්ගයක් ලෙස එම ආයතනයන්හි ක්‍රියාත්මක වැඩසටහන්වල ආර්ථික කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය තහවුරු කරනු වස් විගණන ශිල්පීය ක්‍රම හඳුන්වාදීම සඳහා කාර්ය සාධන විගණන මාර්ගෝපදේශ කෙටුම්පතක් 2015 වර්ෂය තුලදී සකස් කර අවසන් වී ඇත. මෙම කෙටුම්පතට තවදුරටත් ඇතුළත් කළ යුතු කරුණු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇති අතර අභ්‍යන්තර විගණන, මුල්‍ය කේෂත්‍ර හා විගණකාධිපති නියෝජනය කරනු ලබන විශේෂඥයින් සමඟ විශ්ලේෂණය කර සංශෝධනය කිරිමෙන් අනතුරුව 2016 වර්ෂය තුලදී නිකුත් කිරිමට අපේක්ෂිතය.

### 3.2.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විශේෂ විමර්ශන පැවත්වීම පිළිබඳ මාර්ගෝපදේශය

අභ්‍යන්තර විගණකවරුන්ට විශේෂ විමර්ෂන පැවැත්වීමට පැවරෙන රාජකාරි වලදී මඟපෙන්වීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් ආයතන සංග්‍රහයේ විනය කටයුතු සම්බන්ධව ඇති උපදෙස්ද උපයෝගීකර ගනිමින් කෙටුම්පත් කර ඇති අතර අදාල ක්ෂේත්‍රවල විශේෂඥයින්ගේ සාකච්ඡාවට භාජනය කර සංශෝධනය කිරීමෙන් අනතුරුව 2016 වර්ෂය තුලදී නිකුත් කිරිමට අපේක්ෂිතය.

## 3.3. විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම

රජයේ අමාත්‍යාංශයන්හි විගණන හා කළමනාකරණ කමිටුවලට භාණ්ඩාගාර නියෝජිත ලෙස කමිටු සාමාජිකයෙකු වශයෙන් මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වේ.එම නිලධාරීන් විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම ඵලදායීව හා අඛණ්ඩව පැවැත්වීම පිළිබඳව මාර්ගෝපදේශ සැපයීම හා අධීක්ෂණය කිරීම් සිදුකර ඇත. එමෙන්ම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක ශක්තිමත් කිරීමටත්, අභ්‍යන්තර විගණන වාර්තා හා රජයේ විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති විශේෂ කරුණු සම්බන්ධව තීරණ ගැනීමටත් අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතුකර ඇත. තවද කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කිරීමද මගින් රාජ්‍ය අංශයේ කළමනාකරණ කටයුතු ශක්තිමත් කිරීමට දායකත්වය සපයා ඇත.

චක්‍රලේඛ විධිවිධාන අනුව 2015 වසර තුළ අමාත්‍යාංශ 50 ක පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 134 කටද , දෙපාර්තමේන්තු 05 ක පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 17 කටද, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව යන රාජ්‍ය ආයතන වල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 16 කටද මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වී ඇත.

## 3.4. මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය

මුදල් අමාත්‍යාංශය හා භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවලට අදාළ කළමනාකරණ විගණනය සිදු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් සේ සැලකේ. 2015 වර්ෂයේදී ද මෙම කාර්යය සාර්ථකව සිදු කළ අතර, ඒ අනුව පහත දක්වා ඇති සෑම ආයතනයක් වෙනුවෙන්ම කාර්තුවකට එක් කළමනාකරණ විගණන වාර්තාවක් බැගින් කළමනාකරණ විගණන වාර්තා 04 ක් නිකුත් කර ඇත. එමගින් එම ආයතනවල කාර්යක්ෂම හා ඵලදායී අභ්‍යන්තර පාලන විධි ක්‍රම පවත්වාගෙන යාමටත් ඒ තුළින් වඩාත් ඉහළ කාර්ය සාධනයක් ළඟාකර ගැනීමටත් පිටුවහලක් ලැබී ඇත.

මුදල් අමාත්‍යාංශය
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
නීති කටයුතු දෙපාර්තමේන්තුව
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

සංවර්ධන මුල්‍ය දෙපාර්තමේන්තුව

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව

තවද, 2015 වසරේ වෙනත් අමාත්‍යාංශ විෂය පථයට ඇතුලත්වී යලි මුදල් අමාත්‍යාංශ විෂය පථයට ඇතුලත් කරගනු ලැබූ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙනුවෙන් කළමනාකරණ විගණන වාර්තා 03ක් 2015 වර්ෂය තුළ නිකුත් කර ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් 2ක් හා ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව සඳහා 02ක් වශයෙන් විගණන වාර්තා නිකුත් කර ඇත.

## 3.5 විශේෂ විමර්ශන හා විගණන කටයුතු

මුදල් අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වෙත මෙන්ම මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන පැමිණිලි මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ නියමය පරිදි පරීක්ෂා කර වාර්තා කිරිම සඳහා කළමනාකරන විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබයි. එසේ යොමු කරනු ලදුව ඉටුකරන ලද පරීක්ෂණයන්ගේ වාර්තාවක් භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ අදාල ආයතනයේ ප්‍රධානීන් හට යොමු කරනු ලබන අතර විමර්ශනය අනුව හෙලිදරව්වන අඩුපාඩු සහ අක්‍රමිකතා නැවත ඇතිවීම වළක්වා ගැනීම මෙහි අරමුණ වේ.

2015 වර්ෂයේදි කළමනාකරන විගණන දෙපාර්තමේන්තුව මගින් විමර්ශන කටයුතු අවසන්කර ඇති විමර්ශන සංඛ්‍යාව 24ක් වන අතර වසර තුල ඉදිරිපත්වූ පැමිණිලි 14ක් සඳහා තවදුරටත් විමර්ශන සිදුකෙරෙමින් පවතී.

### 2015 වර්ෂයතුලදී අවසන් කර ඇති විමර්ශන

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 01 | දිවිනැගුම දෙපාර්තමේන්තුව | දිවිනැගුම දෙපාර්තමේන්තුවේ අංක 7041562 ගිණුම පරීක්ෂා කිරිම |
| 02 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | ආනයන හා අපනයන දෙපර්තමේන්තුවේ සිදුවන වංචා හා දූෂණ පිළිබඳව |
| 03 | ලංකා ස.තො.ස. | භාණ්ඩාගාර ඇප මත සහල් ආනයනය කිරිම පිළිබඳව |

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 04 | අතුල බාලසූරිය සහ සමාගම | වංචා හා සුරාබදු පිළිබඳව |
| 05 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම් පිළිබඳව |
| 06 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | වංචා, දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව |
| 07 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | සංස්ථාවේ නිලධාරීන්ට බලපෑම් සිදුකිරීම පිළිබඳව |
| 08 | දිවිනැගුම දෙපාර්තමේන්තුව | 2014 නොවැම්බර් හා දෙසැම්බර් මාස දෙකේ වවුචර් පරීක්ෂා කිරීම |
| 09 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු | සුවඳ විලවුන් වර්ග හොරෙන් ගෙන ඒම පිළිබඳව |
| 10 | ශ්‍රී ලංකා මහ බැංකුව | හැටන් නැෂනල් බැංකුව හා මහ බැංකුව අතර සිදුවූ වංචාවක් පිළිබඳව |
| 11 | ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව | අවිධිමත් ගණුදෙනු පිළිබඳව |
| 12 | සුරාබදු දෙපාර්තමේන්තුව | සුරාබදු දෙපාර්තමේන්තුවේ දූෂණ පිළිබඳව |
| 13 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව | රේගු දෙපාර්තමේන්තුවේ නීති විරෝධී ක්‍රියා පිළිබඳව |
| 14 | වෙළඳ හා තීරුබදු දෙපාර්තමේන්තුව | වංචා, දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව |
| 15 | සුරාබදු දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන අක්‍රමිතතාවයන් |
| 16 | සී/ස මිල්කෝ පුද්ගලික සමාගම | දෝෂ සහගත හා අවිධිමත් උසස්වීම් පිළිබඳව |
| 17 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | රජයේ මුදල් අවභාවිතය |

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 18 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | අභ්‍යන්තර විගණකගේ වැඩ තහනම් කිරීම පිළිබඳව |
| 19 | සුරාබදු දෙපාර්තමේන්තුව | අරක්කු බෝතල් 7ක් මංකොල්ලකෑම පිළිබඳව |
| 20 | සුරාබදු දෙපාර්තමේන්තුව | DCSL සමාගමේ සිදුවන දූෂණ වංචා පිළිබඳව |
| 21 | සුරාබදු දෙපාර්තමේන්තුව | අල්ලස් හා දූෂණ පිළිබඳව |
| 22 | සුරාබදු දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුවේ අක්‍රමිකතා පිළිබඳව |
| 23 | අධ්‍යාපන අමාත්‍යාංශය | නිල ඇඳුම් බෙදාදීම පිළිබඳව |

## 2015 වර්ෂය අවසන්වන විට ඉදිරියට යමින් පැවති විමර්ශන කටයුතු

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 01 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | රජයේ ආදායම් වළක්වාලමින් අයථා ලෙස මුදල් රැස්කරන නිලධාරීන් |
| 02 | තැපැල් දෙපාර්තමේන්තුව | දිවයිනේ සියළුම තැපැල් අංශවල දූෂණයන් |
| 03 | දිවිනැගුම දෙපාර්තමේන්තුව | සමෘද්ධි සමාජ ආරක්ෂක අරමුදලින් දහම් පාසල් නිල ඇඳුම් බෙදා හැරීම |
| 04 | ක්‍රීඩා අමාත්‍යාංශය | ශ්‍රී ලංකා මල්ලව පොර සංගමයේ මූල්‍ය අක්‍රමිකතා |
| 05 | ලෝහෝර් ආර්යා ණය අරමුදල | ලෝහෝර් ආර්යා ණය අරමුදලේ වර්තමාන තත්ත්වය |
| 06 | Focus Marketing and Engineering | දිස්ත්‍රික් ව්‍යාපෘති ඉංජිනේරු බලය අයථා ලෙස භාවිතා කිරීම |
| 07 | සුරාබදු දෙපාර්තමේතුව | දෙපාර්තමේන්තුවේ නව පරිපාලනයට එරෙහි චෝදනා පිළිබඳව |
| 08 | සුරාබදු දෙපාර්තමේන්තුව | රා රේන්ද බලපත්‍ර ප්‍රදානයේදී අයථා ක්‍රියා සිදු කිරීම<br>මාසික රේන්ද වාරික නොගෙවීම |

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 09 | තැපැල් දෙපාර්තමේන්තුව | වංචනිකව සිදුවන රාජ්‍ය මුදල් ගසා කෑම අනුරාධපුර තැපැල් කාර්යාලයේ දුර්වල පරිපාලනය නිසා මුදල් අවභාවිතය |
| 10 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුවේ සිදුවන වංචා |
| 11 | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | දූෂණ |
| 12 | පේරාදෙණිය රෝහල | මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීම |
| 13 | සෞඛ්‍ය අමාත්‍යාංශය | රෝහල් පිරිසිදු කිරීමේ සේවාව |
| 14 | ජාතික විද්‍යා සභාව | රාජ්‍ය මුදල් අයතා පරිහරණය |


## 3.6 නව ප්‍රවේශයන්

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු,පළාත් සභා,ව්‍යවස්ථාපිත ආයතන හා ව්‍යාපෘතිවලට අයත් වාහන සම්බන්ධ දත්ත පද්ධතියක් නිර්මානය කර නඩත්තු කිරිමේ කටයුතු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත.

රජයේ වත්කම් සම්බන්ධ ආරක්ෂාව හා අභ්‍යන්තර පාලනය මුලික කරගනිමින් වංචල වත්කමක් වන රජයේ වාහන සම්බන්ධ අවස්ථානුකුල වෙනස්කිරීම් එනම්, මිලදී ගැනීම් ,මාරුකිරිම්,අපහරණයන් ආදිය පිළිබඳව තොරතුරු යාවත්කාලීන කරගනිමින් වාහන සම්බන්ධ ආරක්ෂාව තහවුරු වන පරදි අඛන්ඩ සුපරීක්ෂණයක් පවත්වා ගැනීම මින් අරමුණු කරගෙන ඇත. මෙම දත්ත පද්ධතිය නවීන තොරතුරු තාක්ෂණය අනුව වඩා දියුණු දත්ත පද්ධතියක් දක්වා උසස් කිරිමටත් එමඟින් රජයේ වාහන පිළිබඳ නිවැරදි කාලීන තොරතුරු අවශ්‍ය විටෙක ලබාගැනිමට ඇති හැකියාව සාක්ෂාත් කිරිමත් අපේක්ෂාකරයි.

## 04. මානව සම්පත් කළමනාකරණය හා සාමාන්‍ය පරිපාලනය

### 4.1. 2015.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය




කා.සේ.සේ.. – 4; රියදුරු -5; , ස.නි. - සංවර්ධන නිලධාරී , ක.ස. - කළමනාකරණ සහකාර

ප්‍ර.රා.ක.ස. - ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර

## 4.2. කාර්ය මණ්ඩලය

## 2015.12.31 දිනට කාර්ය මණ්ඩලය

| තනතුර | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ප.සේ.) | 01 | - | 01 |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ග.සේ.) | 05 | 05 | - |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ක්‍ර.සේ.) | 02 | 01 | 01 |
| සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ග.සේ.) | 07 | 03 | 04 |
| පර්යේෂණ සහකාර / සංවර්ධන සහකාර | 06 | 06 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 14 | 14 | 00 |
| රියදුරු | 07 | 04 | 03 |
| කා.සේ.සේ. | 04 | 04 | - |
| එකතුව | **48** | **39** | **09** |

## 2015 වර්ෂයේ ස්ථාන මාරු ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරීන්

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 1. | ඒ.ආර්. සෙනෙවිරත්න බණ්ඩා මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2015-04-29 |
| 2. | සී.ජේ.කේ. පෙරේරා මහතා | අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 2015-02-18 |
| 3. | ජේ.එච්.ප්‍රනාන්දු මහත්මිය | සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 2015-11-18 |
| 4. | බී.ටී.එන්. මාලි මිය | සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 2015-12-30 |
| 5. | කේ.ඒ.ඩී.ආර්.ටී. කහඳවආරච්චි මිය | සංවර්ධන නිලධාරී | 2015-02-18 |
| 6. | ඩබ්.ජී.මනෝජා මෙනවිය | සංවර්ධන නිලධාරී | 2015-11-03 |
| 7. | ජේ.පී. මුදලිගේ මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015-02-05 |
| 8. | ඩී.එස්.පී. වික්‍රමරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015-05-11 |
| 9. | ඩබ්.ඒ.පී.ඩී. විතානාරච්චි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015-05-11 |
| 10. | ජේ.ඒ.සන්ධ්‍යා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015-05-12 |

| | | | |
|---|---|---|---|
| 11. | ඩී.තුසිත් චන්දිම මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015-06-01 |
| 12. | ජේ.ඒ.ජී.එන්. ජයකොඩි මහතා | කා.සේ.සේ. | 2015-11-02 |
| 13. | ඒ.පී.ඒ. රත්නසිරි මයා | රියදුරු | 2015-04-20 |
| 14. | ඒ.චන්දන පෙරේරා මයා | රියදුරු | 2015-09-04 |
| 15. | ඩබ්.ආර්.ජයන්ත මයා | රියදුරු | 2015-09-30 |

නව පත්වීම්ලාභී රා.ක.ස. කේ.පී.ආර්.ඩී. කරුණානායක මෙනවිය - 2015.09.15

## 2015 වර්ෂයේ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරීන්

| | නම | තනතුර | ස්ථාන මාරුවී ගිය දිනය |
|---|---|---|---|
| 1. | ඩී.යු.එස්. වික්‍රමාරච්චි මයා | අති.අධ්‍යක්ෂ ජනරාල් | 2015-04-21 |
| 2. | සී.ජේ.කේ.පෙරේරා මහතා | අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 2015-05-06 |
| 3. | ඒ.කේ.ගුණසේකර මෙය | අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ක්‍ර.සේ. | 2015-04-01 |
| 4. | පිවිනි විජේවර්ධන මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015-02-06 |
| 5. | ඩබ්.පී. කල්‍යාණි ගුණරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015-05-15 |
| 6. | එස්.එම්.ටී. නිරාශා මිය | සංවර්ධන නිලධාරී | 2015-11-22 |
| 7. | ඒ.පී. නාලක චන්දන මහතා | කා.සේ.සේ. | 2015-10-23 |
| 8. | එච්.එම්.එම්. රත්නසිරි මහතා | රියදුරු | 2015-08-25 |
| 9. | ඒ. චන්දන පෙරේරා මහතා | රියදුරු | 2015-10-01 |
| 10. | ජේ.එම්.එල්. පුෂ්පකුමාර මහතා | රියදුරු | 2015-05-31 |
| 11. | ඒ.පී.ඒ. රත්නසිරි මහතා | රියදුරු | 2015-05-12 |

## 4.3. 2015 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු

### 4.3.1. 2015 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා

| නිලධාරියාගේ නම | තනතුර | පැවැත්වූ රට | පුහුණු පාඨමාලාව | කාලය |
|---|---|---|---|---|
| එස්.ඒ.සී. කුලතිලක මහත්මිය | අධ්‍යක්ෂ ජනරාල් | මලයාසියාව | ADB Regional Fourm on public Sector Accounting – Invitation to attend the 2015 Regional workshop | 2015.08.24 - 2015.08.25 |
| | | මලයාසියාව | Overseas Training Program for Executive Official – 2015 Leadership,Communication & Interpersonal Skills Leadership through Self-Master | 2015.08.29- 2015.09.07 |
| | | ස්විට්සර්ලන්තය | Intergovernmental working group of experts on International standards of Accounting and Reporting 32nd Session Geneva | 2015.11.04- 2015.11.06 |
| ඒ.ආර්. සෙනෙවිරත්න බණ්ඩා මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | මලයාසියාව | Overseas Training Program for Executive Official – 2015 The Oxford Advanced Finance programme | 2015.09.12 - 2015.09.22 |
| ආර්.ආර්.කේ.නුගපිටිය මහතා | අධ්‍යක්ෂ | මලයාසියාව | Overseas Training Program for Executive Official – 2015 Leadership, Communication & Interpersonal Skills Leadership through Self-Master | 2015.08.29- 2015.09.07 |
| එස්.එම්.දයාරත්න මහතා | අධ්‍යක්ෂ | මලයාසියාව | -එම- | 2015.08.29 - 2015.09.07 |
| ඩී.ජී.ජී.එස්. දයානාත් මහතා | අධ්‍යක්ෂ | මලයාසියාව | -එම- | 2015.08.28 - 2015.09.07 |
| එම්.ඒ.කේ.පී. විජේවන්ත මහත්මිය | අධ්‍යක්ෂ | මලයාසියාව | Overseas Training Program for Executive Official – 2015 The Oxford Advanced Finance programme | 2015.09.12 - 2015.09.22 |
| ඒ.එන්. හපුගල මහතා | අධ්‍යක්ෂ | මලයාසියාව | Overseas Training Program for Executive Official – 2015 The Oxford Advanced Finance programme | 2015.09.12 - 2015.09.22 |

| නිලධාරියාගේ නම | තනතුර | පැවැත් වූ රට | පුහුණු පාඨමාලාව | කාලය |
|---|---|---|---|---|
| එස්.කේ. කුසලකුමාරන් මහතා | අධ්‍යක්ෂ | මලයාසියාව | Overseas Training Program for Executive Official – 2015 The Oxford Advanced Finance programme | 2015.09.12 - 2015.09.22 |
| වී.අයි. දිල්හානි මෙය. | සහකාර අධ්‍යක්ෂ | ජපානය | Japanese Grant Aid for Human Resource Development Scholarship (JDS) 2015 | 2015.08.16 - 2017.08.16 |
| ඩබ්.කේ.පී.එච්.එන්.එස්. රුද්‍රිගු මහත්මිය | සංවර්ධන නිලධාරී | මලයාසියාව | Overseas Training Program for Executive Official – 2015 The Oxford Advanced Finance programme | 2015.09.12 - 2015.09.22 |

### 4.3.2. 2015 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා

| පුහුණු පාඨමාලාව / වැඩසටහන | පුහුණු කාලය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|---|
| කළමනාකරණ සහකාර සේවයේ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 2015.01.22 සිට වසර 05ක් | ඩබ්.ජී.ටී. චානක මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| **Behavioral Economics and Policy Design** | **2015.02.25** සහ 26 | ඒ.එන්.හපුගල මහතා<br>ඒ.කේ. ගුණසේකර මෙය<br>ඩබ්.ඩී.එස්.කේ.අලගියවන්න මිය | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>සංවර්ධන නිලධාරී |
| කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 2015.03.16/17 | කේ.එච්.එම්. කපුවත්ත මිය<br>එස්.එම්.ටී. නිරාශා මිය | සංවර්ධන නිලධාරී<br>සංවර්ධන නිලධාරී |
| **Asian Leadership Forum 2015** | **2015.06.01** | එස්.කේ.කුසලකුමාරන් මහතා | අධ්‍යක්ෂ |
| **Training on Sri Lanka Public Sector Accounting Standards ( SLPSAS)** | **2015.06.12** | ආර්.ආර්.කේ. නුගපිටිය මයා<br>එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය<br>එස්.එම්. දයාරත්න මහතා<br>ඒ.එන්.හපුගල මහතා<br>එස්.කේ.කුසලකුමාරන් මහතා | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ |

| පුහුණු පාඨමාලාව / වැඩසටහන | පුහුණු කාලය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|---|
| **Corporate Fraud Detection and Forensic Accounting training** | **2015.07.15** | එස්.ඒ.සී. කුලතිලක මිය<br>එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය<br>එස්.කේ.කුසලකුමාරන් මහතා | අධ්‍යක්ෂ ජනරාල්<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ |
| ගබඩාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 2015 .07.30 දින සිට බ්‍රහස්පතින්දා දින 05ක් | පී.ඩබ්.බී.එම්.විමලචන්ද්‍ර මහතා | රා.ක.ස. |
| පරිගණක දෘඩාංග පුහුණුව | 2015.08.10/11 | ජී.ඩී.කේ. ලියනගේ මිය<br>ඊ.එම්.ජී.එල්. ඒකනායක මිය | රා.ක.ස.<br>රා.ක.ස. |
| ඊ- රාජ්‍ය සංකල්පය සහ කාර්යාල කළමනාකරණයේදී තොරතුරු තාක්ෂණ භාවිතය පිළිබඳ වැඩමුළුව | 2015.08.26 හා 27 | ඊ.එම්.ජී.එල්. ඒකනායක මිය | රා.ක.ස. |
| ගබඩාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 2015.08.28 දින සිට සිකුරාදා දින 10ක් | පී.ඩබ්.බී.එම්.විමලචන්ද්‍ර මහතා | රා.ක.ස. |
| **Advance Analysis Tools in Excel** | 2015.10.09 | ජී.ඩී.කේ. ලියනගේ මිය<br>ඊ.එම්.ජී.එල්. ඒකනායක මිය | රා.ක.ස. |
| **Procurement Management** | 2015.10.09 | ඩබ්.කේ.පී.එච්.එන්.එස්.රුද්‍රිගු<br>ඩී.එස්.පී. වික්‍රමරත්න මිය<br>ජේ.ඒ. සන්ධ්‍යා මිය<br>ජේ.පී. මුදලිගේ මහතා | සංවර්ධන නිලධාරී<br>රා.ක.ස.<br>රා.ක.ස.<br>රා.ක.ස. |

### 4.3.3 කාර්යාභිවර්ධන වැඩසටහන්

කළමනාකරන විගණන දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා " කළමනාකරණ විගණනයේදී අවදානම් කළමනාකරණය " පිළිබඳ පුහුණු වැඩමුළුවක් 2015.12.31 දින පවත්වන ලදී.